# සුනාමි අභියෝගය - කර්මාන්ත යළි නගාසිටුවීම සහ ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය

## දෙසැම්බර් 26 දා

2004 වර්ෂයේ අවසාන භාගය එළඹ තිබිණ. ඒ දෙසැම්බර් 26 වෙනි ඉරු දින උදයයි. දකුණු හා නැගෙනහිර ආසියාතික වෙරළ තීරය, සුපුරුදු පරිදි, සයුරේ පහස ලබමින් තිබිණ. ඒ අතරතුර වෙරළ තීරයෙහි ( මෑත දියඹ - infront shore) පෙර නොවූ විරූ වෙනසක් සිදු වුවත්, එය කුමන ප්‍රපංචයක පෙරනිමිත්තක්දැයි අනාවැකි පළකරන්නට තරම් සාමාන්‍ය ජනතාව පොහොසත් වූයේ නැත. නිමේෂයකින්, වියරුවූ රළ පහර ගොඩබිම ගිලගන්නට වූයේ, ලෝක විනාශය මේ යැයි සිහිගන්වමිනි. විනාඩි කිහිපයකින් සියල්ල සිදුවී හමාර විය. ප්‍රතිඵලය වූයේ, වෙරළාසන්න ජීවිත හා දේපළ සියල්ල ඓතිහාසික සංහාරයකට ලක්වීමයි.

## සුනාමි ( TSunami )

"සු "( TSU) යන්නෙන් වරායත් ( harbour ) "නාමි" (nami) යන්නෙන් රළත් ( wave ) අර්ථ ගැන්වේ. මේ වචනය, ශ්‍රී ලංකාවට නුහුරු වූයේ එහි බලපෑමක් කිසිදාක අත්විඳ නොතිබූ හෙයිනි. ඉන්දියාවේ සුනාමි සම්බන්ධ විද්වතෙකු වන ශ්‍රී සිබාල් ( Shri Sibal ) ප්‍රකාශ කරන්නේ, 1900 සිට පැසිපික් සාගරය තුළ සුනාමි තත්ත්වයන් 790 ක් පමණ වාර්තාවී ඇති බවයි. 1941 වසරේ, ඉන්දියාවට ප්‍රබලව දැණුනු සුනාමි තත්ත්වයට පසුව, මෑත අත්දැකීම් දුලබ වූ හෙයින්, ශ්‍රී ලංකා ජනතාව කිසිත් දැන සිටියේ නැත. එහෙයින්, රික්ටර් මාපකයේ 9.2 ක් වාර්තා වීමෙන් අපේක්ෂිත විනාශයට වඩා, අනපේක්ෂිත විනාශයක් ශ්‍රී ලංකාවට අත්විඳින්නට සිදු විය. එය 'පල්ලෙකැලේ' හෝ පේරාදෙණිය සරසවියේ භූ කම්පන නිරීක්ෂණ මධ්‍යස්ථාන ( භූ කම්පන මිනුම් කරනු ලබන) වලට ග්‍රහණය කර ගැනීමටද හැකියාවක් නොවීමද, පෙර සූදානම්වීමේ ඉඩ මගහරවාලීමකි.

## ශ්‍රී ලංකා අත්දැකීම හා බලපෑම

සුනාමි තත්ත්වය රටක් වශයෙන් ශ්‍රී ලංකාවට ප්‍රබලව දැනුණේ , සුමාත්‍රාවට ( අපකේන්ද්‍රයට) ආසන්නව පිහිටා ඇති හෙයින් හා දූපතක් ( Island ) වූ හෙයිනි. මේ මගින්, ගම්පහ, කොළඹ, කළුතර, ගාල්ල, මාතර, හම්බන්තොට, අම්පාර, මඩකලපුව, ත්‍රිකුණාමලය, මුලතිව් හා යාපනය යන දිස්ත්‍රික්කයන්හි වෙරළ තීරය බලපෑමට ලක් විය.

අප රට දියුණු වෙමින් පවතින ( Developing ) රටක් වුවා සේම, සිදුවූ විනාශයද ප්‍රබල විය. සමස්තයක් ලෙස, හතළිස් දහසකට (40,000 ) අධික පිරිසක් මියගිය අතර, ලක්ෂ සංඛ්‍යාත පිරිසකට උන්හිටිතැන් අහිමිවිය. එමෙන්ම දහස් සංඛ්‍යාත ප්‍රමාණයක් අතුරුදහන් වී හා තුවාල ලබා ඇත. දළ වශයෙන් රටට වූ හානිය රුපියල් බිලියන 150 කටත් වැඩි බව ගණන් බලා ඇත.

## ශ්‍රී ලංකා වෙරළ තීරය

ශ්‍රී ලංකාවේ මුළු වර්ග ප්‍රමාණය වර්ග කිලෝ මීටර් ( $Km^2$) 65610 කි. රටෙහි වෙරළ තීරයේ දිග දළ වශයෙන්, කිලෝ මීටර් 2776 ක් (මී. 2776000) බව ගණන් බලා ඇත. රජයේ ඉදි කිරීම් ප්‍රතිපත්තියට අනුව, වෙරළ තීරයේ සිට මීටර් 100 ක් ඇතුළත ඉදි කිරීම් සියල්ල තහනම්ය. මේ අනුව මේ තීරයට දළ වශයෙන්, හෙක්ටයාර් 26,735 ක් ( වර්ග මීටර් 267355614 ක්) අයත්වේ.

## ස්වභාවික විපත් අවම කිරීම

ශ්‍රී ලංකාවේ භූගෝලීය පිහිටීම අධ්‍යයනය කරන විට, භූ කම්පන හා ඉන්වන අතුරු උපද්‍රවයන්ට ලක්වීමේ හැකියාව ඉතා අඩුය. එනම් ශ්‍රී ලංකාව පැසිපික් ගිනිවළල්ලෙන් පිටත පිහිටි රටක් වීම නිසාය. කෙසේ නමුත්, වර්තමානයේ සිදුවී ඇති වෙනස්කම් අනුව, අප රටට බලපෑමක් නොවේ යැයි අනාවැකි පළකල නොහැකිය. එහෙයින්, පෙර සූදානම්වීම් සඳහා, පුළුල් වූත්, සූක්ෂම වූත්, සන්නිවේදන ජාලයක් අප රටට අවශ්‍යව ඇත.

## යළි නැඟී සිටීම

සුනාමි ඛේදවාචකයෙන් රටට වූ මහත් විපත හමුවේ, අදාළ ප්‍රදේශයන්හි ආර්ථිකමය, සමාජමය, සංස්කෘතිකමය හා දේශපාලනික වටාපිටාව කුමන තැනකින් යළි ගොඩනැගීම ඇරඹිය යුතුද යන්නට නියමාකාර පිළිතුරක් මෙතෙක් ඉදිරිපත් වී නැත. එමෙන්ම මේ විනාශයේ අළු දූලි මගින් ගොඩනගන නව ශ්‍රී ලංකාව කුමක්ද යන්න පිළිබඳව මනා දැක්මක් අවශ්‍යව ඇත.

උක්ත කරුණු කාරණා හමුවේ, රටේ ආර්ථික ක්ෂේත්‍රයට සෘජුවම බලපෑමක් කළ " කර්මාන්ත අංශය" යළි පණ ගන්වන්නේ කෙසේද? යන්න මේ වැයමේ මූලික අරමුණ වේ.

### කර්මාන්ත සමීක්ෂණය (සුනාමියෙන් පසු)

ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය විශාල පරිශ්‍රමයක් දරා 2005 ජනවාරි මස 15 වන දින සිට 30 දින දක්වා වූ කාල පරාශය තුළ විනාශවූ කර්මාන්ත සම්බන්ධව කළ කඩිනම් සමීක්ෂණයක් මගින් ඉදිරි ඉදි කිරීම් සැලසුම් හා සංවර්ධන ක්‍රමෝපායන් සඳහා අවශ්‍ය තොරතුරු රාශියක් අනාවරණය කරගෙන ඇත.

මේ සමීක්ෂණය මගින් ගම්පහ, කොළඹ, කළුතර, ගාල්ල, මාතර, හම්බන්තොට, අම්පාර, මඩකලපුව, ත්‍රිකුණාමලය, මුලතිව් හා යාපනය යන බලපෑමට ලක්වූ දිස්ත්‍රික්ක සියල්ල ආවරණය කර ඇත.

### අනාවරණ

මේ මගින් බලපෑමට ලක්වූ කර්මාන්ත 4389 ක්, එනම් ක්ෂුද්‍ර, කුඩා, මධ්‍ය පරිමාණ හා විශාල යන කර්මාන්ත වර්ග සම්බන්ධව සියලුම තොරතුරු දිස්ත්‍රික්ක, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ හා ග්‍රාම නිලධාරී වසම් මට්ටමින් හඳුනාගෙන විග්‍රහ කර ඇත. සමස්තයක් ලෙස පළාත් හා දිස්ත්‍රික්ක මට්ටමින් වූ බලපෑම අංක 01 වගුවෙන් දක්වා ඇත.

**වගු අංක 01**

**බලපෑමට ලක්වූ කර්මාන්තවල ක්ෂේත්‍රිය ව්‍යාප්තිය**

| පළාත | දිස්ත්‍රික්කය | බලපෑමට ලක්වූ කර්මාන්ත සංඛ්‍යාව | | | | |
|---|---|---|---|---|---|---|
| | | ක්ෂුද්‍ර | කුඩා | මධ්‍යම | විශාල | එකතුව |
| බස්නාහිර | කොළඹ | 149 | 182 | 02 | 06 | 339 |
| | කළුතර | 90 | 197 | 11 | 04 | 302 |
| | ගම්පහ | 06 | 15 | 02 | 04 | 27 |
| නැගෙනහිර | අම්පාර | 472 | 121 | 03 | 03 | 549 |
| | මඩකලපුව | 191 | 112 | 00 | 00 | 303 |
| | ත්‍රිකුණාමලය | 145 | 131 | 05 | 04 | 285 |
| දකුණ | ගාල්ල | 537 | 347 | 21 | 24 | 929 |
| | මාතර | 516 | 328 | 12 | 05 | 861 |
| | හම්බන්තොට | 321 | 178 | 13 | 02 | 514 |
| උතුර | යාපනය | 40 | 32 | 04 | 00 | 76 |
| | මුලතිව් | 176 | 27 | 01 | 00 | 204 |
| එකතුව | | 2593 | 1670 | 74 | 52 | 4389 |

Source : Survey on TSunami Affected Industries 2005 Conducted by I.D.B

සංඛ්‍යාලේඛන සාධකයන්ට අනුව, ක්ෂුද්‍ර හා කුඩා පරිමාණ කර්මාන්ත කෙරෙහි විශේෂ අවධානයක් යොමු කළ යුතුව ඇත. සමීක්ෂණයෙන් හඳුනාගත් විනාශයට ලක්වූ කර්මාන්ත 4389 න් 2593 ක් ම ක්ෂුද්‍ර ( Micro) පරිමාණ කර්මාන්ත වූ අතර, ඉන් 833 ක් කොහු ආශ්‍රිත (coir) නිෂ්පාදන හා 713 ක් (textile) රෙදි නිෂ්පාදන ආශ්‍රිත කර්මාන්ත විය. එමෙන්ම කර්මාන්ත 1670 ක් කුඩා පරිමාණ (small) කර්මාන්ත වූ අතර, ඉන් 293 ක් ලී භාණ්ඩ (wooden products) ආශ්‍රිත නිෂ්පාදනද, 284 ක් වෙළඳ හා සේවා සපයන (business and services) කුඩා ව්‍යාපාර සහ කර්මාන්තද විය. ඊට අමතරව 74 ක් මධ්‍යම පරිමාණ (medium scale) හා 52 ක් විශාල පරිමාණයේ (large scale) කර්මාන්ත ලෙස හඳුනාගෙන ඇත.

### ප්‍රාග්ධනය


කර්මාන්ත ක්ෂේත්‍රයේ විනාශයට පත්වූ සම්පූර්ණ ප්‍රාග්ධනය, ආංශිකව (එනම් යන්ත්‍රෝපකරණ අමුද්‍රව්‍ය, නිමි හා අර්ධ නිමි භාණ්ඩ, රථවාහන හා වෙනත්) රුපියල් මිලියන 1400 ක් ලෙස ගණන් බලා ඇත. ප්‍රස්ථාර අංක 01 මගින් එම ආංශික ප්‍රාග්ධන දායකත්වය දක්වා ඇත.

**විනාශවූ ප්‍රාග්ධනයේ ආංශික දායකත්වය**

| මූලය | ප්‍රමාණය (රුපියල් මිලියන) |
|---|---|
| යන්ත්‍රෝපකරණ | 565 |
| අමුද්‍රව්‍ය | 387 |
| නිමි හා අර්ධ නිමි භාණ්ඩ | 340 |
| රථ වාහන | 72 |
| වෙනත් | 36 |
| එකතුව | 1400 |

*Source : Survey on TSunami Affected Industries 2005* Conducted by I.D.B

**ප්‍රස්ථාර සටහන 01**




*Source : Survey on TSunami Affected Industries 2005* Conducted by I.D.B

මේ අනුව යන්ත්‍රෝපකරණ, අමුද්‍රව්‍ය සහ නිමි හා අර්ධ නිමි භාණ්ඩ සඳහා වූ ප්‍රාග්ධන විනාශයක ප්‍රතිශතාත්මකව ඉහළ අගයක් ගෙන ඇත. මෙතරම් විශාල ප්‍රාග්ධන විනාශයක් මෙරට කුඩා හා මධ්‍යම කර්මාන්ත ක්ෂේත්‍රයට සිදුවීම ශ්‍රී ලංකා ආර්ථිකයට බලවත් පහරකි. මෙසේ හානියට පත් කර්මාන්ත , ආහාර නිෂ්පාදන, කොහු භාණ්ඩ, දැව හා ගෘහ භාණ්ඩ, ලුහු ඉංජිනේරු, කෘෂි කාර්මික, රබර් ආශ්‍රිත නිෂ්පාදන, කඩදාසි , අත්කම් භාණ්ඩ, ස්වර්ණාභරණ යන නිෂ්පාදන ක්ෂේත්‍ර රාශියක් අයත්වේ.

### ජීවිත හා දේපළ

විශේෂයෙන්ම සමීක්ෂණයෙන් හෙළිදරව් වූ නවත් වැදගත් කරුණක් වූයේ සැලකිය යුතු කර්මාන්තකරුවන් පිරිසක් එනම්, සෘජුවම 164 දෙනෙක් මියගොස් හෝ අතුරුදහන්ව ඇති අතර, 141 ක් තුවාල ලබා ඇත. මෙහිදී විශේෂයෙන්ම මියගිය කර්මාන්තකරුවන්ගේ පවුල් පිළිබඳවත්, තුවාල ලබා ඇති කර්මාන්තකරුවන් යළි පුනරුත්ථාපනය කිරීම සම්බන්ධවත් විශාල වගකීමක් අප කාහටත් පැවරී ඇත.

එමෙන්ම සමස්තයක් ලෙස කර්මාන්ත හා සම්බන්ධව හානියට පත් භූමි ප්‍රමාණය වර්ග අඩි 5,314,519 ක්වූ අතර, ඉන් 549,281 ක් අම්පාර දිස්ත්‍රික්කය හා 2,619,259 ක් කළුතර දිස්ත්‍රික්කයටද අයත් වේ. ඒ අනුව මෙහි මූල්‍යමය වටිනාකම ඉතා ඉහළ අගයක් ගනී.

### විශ්ලේෂණ

ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය සිය කර්මාන්ත සමීක්ෂණය මඟින් උකහා ගත් තොරතුරු එල්ලයන් දෙකක් ඔස්සේ විශ්ලේෂණයට භාජනය කර ඇත.

1. ක්ෂේත්‍රීය ( spatial ) තොරතුරු/දත්ත

2. ක්ෂේත්‍රය නොවන ( aspatial ) තොරතුරු/දත්ත

ක්ෂේත්‍රීය මූලාශ්‍ර වූයේ, විනාශයට පත්වූ කර්මාන්ත, ක්ෂේත්‍රීයව ස්ථානගතවී ඇත්තේ කුමන ස්ථානයන්හේද? යන්නයි. මෙහිදී භූගෝලීය තොරතුරු පද්ධති ( GIS ) ආශ්‍රයෙන් ප්‍රායෝගික ගැටළු රූසකට විසඳුම් ලබා ගැනීමට හැකිවී ඇත. මේ වනවිට ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය අවශ්‍ය සිතියම් සියල්ල සකස් කර ඇත.

ක්ෂේත්‍රීය නොවන මූලයන් වූයේ විනාශයට ලක්වූ කර්මාන්ත පිළිබඳ සියලුම විස්තරයි/තොරතුරුයි.

මේ අනුව, ඉදිරි සැලසුම් උක්ත දෙඅංශයේ එකතුවෙන් නිර්මාණයවීම ප්‍රායෝගිකව ඉතා වැදගත්ය.

### පළමු පියවර

විශේෂයෙන්ම කුඩා කර්මාන්ත අංශය සංවර්ධනය වෙමින් පවතින රටක් ලෙස ශ්‍රී ලංකාවේ දළ ජාතික නිෂ්පාදිතයට කරනු ලබන දායකත්වය අතිමහත්ය. එහෙයින් මේ වනවිටත් ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය කුඩා පරිමාණ කර්මාන්ත යළි නඟාසිටුවීම සඳහා විශේෂ වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කර ඇත. මේ අනුව කර්මාන්ත යළි නඟාසිටුවීමේ ක්‍රියාදාමයේ අරමුණු, ක්‍රමෝපායන් හා ඉලක්ක නිවැරදි දිශාවට යොමු කරලීමට අවශ්‍ය මඟපෙන්වීම ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය සතුව ඇත.

### යළි ගොඩනගමු

මේ අනුව තෝරා ගත් ව්‍යාපාර ක්ෂේත්‍රයන් 09 ක කර්මාන්තකරුවන් 2394 ක් සඳහා අවශ්‍ය උපකරණ හා අමුද්‍රව්‍ය බෙදා දීමේ වැඩ සටහනක් ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය ක්‍රියාත්මක කොට තිබේ. මෙහි පළමු අදියර මඟින් රු. 15,000/- ක උපරිමයකට යටත්ව, ක්ෂේත්‍රයන් රාශියක් සඳහා උපකරණ බෙදා දීම සිදු කෙරේ. එනම්, ලණු ඇඹරුම් කර්මාන්ත, ඉලෙක්ට්‍රොනික් භාණ්ඩ නිෂ්පාදන හා අළුත්වැඩියාව, වඩු කර්මාන්තය, සිමෙන්ති ආශ්‍රිත නිෂ්පාදන, බේකරි සහ රසකැවිලි නිෂ්පාදන, ඇඟළුම් කර්මාන්තය, යතුරු පැදි අළුත්වැඩියාව, පාපැදි අළුත්වැඩියාව හා ලොන්ඩරි වශයෙනි.

මේ වනවිට ගාල්ල, මාතර, හම්බන්තොට සහ මඩකලපුව යන දිස්ත්‍රික්ක සඳහා උපකරණ කට්ටල සහ අමුද්‍රව්‍ය සපයා අවසන්ය. ඉතිරි දිස්ත්‍රික්කයන් සඳහාත් 2005 අප්‍රේල් මස අවසන් වීමට පෙර උපකරණ බෙදා අවසන් කිරීමට ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය සැලසුම් කර ඇත.

### අධිෂ්ඨානය

අප නැවත නැඟී සිටින ප්‍රයත්නයේ, ප්‍රතිපත්ති සැදීමේ හා කළමනාකරණ ක්‍රියාවලිය, සඵල කර ගැනීම සඳහා, පුළුල් ජාතික ඒකාබද්ධ වැඩසටහනක් ක්‍රියාවට නැඟීම අත්‍යාවශ්‍යව ඇත. එහෙයින්, සියලු දෙනා සියලු දෙනාගේ වගකීමක් ලෙස සලකා, මෙම ක්‍රියාදාමයට එකතු වේ නම්, සුනාමි විපත් ජය ගැනීම එතරම් අපහසු අභියෝගයක් නොවනු ඇත.

### මූලාශ්‍ර :

01. Survey Report on TSunami Affected Inudustries (15 - 20) January - 2005

02. CSIR News
Vol 55 No 5, 15 March - 2005